ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ம்மாடி "ஆ" ஹரிச்சந்திரா மாவத்த, அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquries: 025-2235790
Fax : 025-2224914 E-mail csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: එන්සීපී/සීඑස්/ඊඩී/17/3-1
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.11. 14

ආයතන චක්‍රලේඛ 2022/04 - (II)

උතුරු මැද පළාත්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>රාජකාරී සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කිරීම</u>

උක්ත කරුණට අදාලව මා විසින් නිකුත් කර ඇති 2022.11.03 දිනැති ආයතන චක්‍රලේඛ 2022/04ට හා මගේ සමාංක හා 2024.10.22 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2018 අනුව සහනදායි පදනම මත වාහන ආනයන බලපත්‍රයක් ලබාගැනිම සඳහා ඉල්ලුම් කිරිමේදි ඉහත අංක දරන චක්‍රලේඛනය මඟින් හඳුන්වා දි ඇති CS – 2 ආකෘති පත්‍රයෙහි (Check List) සඳහන් පරිදි ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන වලට අමතරව , උක්ත අංක දරණ මගේ සමාංක 2024.10.22 දිනැති ලිපිය මඟින් වාහන ආනයන බලපත්‍රය ලබා ගැනිම සඳහා, හිමිකම් ඇති තනතුරකට පත් වී පළමු වරට සහනදායි පදනම මත වාහන ආනයන බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරිමේදි (සක්‍රීය සේවා කාලය වසර 06 සම්පූර්ණ වී) අදාල නිලධාරියා එම තනතුරෙහි රාජකාරී භාර ගැනිමේ ලිපියෙහි සහතික කල පිටපතක්ද ඉදිරිපත් කල යුතු බව මා විසින් දැනුම් දී ඇත.

03. නමුත්, එසේ දැනුම් දී තිබුනද දිගින් දිගටම එම ගැටළුව පැන නැගිම හේතුවෙන් මෙම ආයතනය විසින් නිකුත් කර ඇති ආයතන චක්‍රලේඛ 2022/04 හි CS 2 ආකෘතියට අදාලව, "CS 2 (I සංශෝධන)" ලෙස නව ආකෘතියක් හඳුන්වා දෙනු ලබන අතර, මින් ඉදිරියට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2018 ප්‍රකාරව පළමු වරට සහනදායි පදනම මත වාහන ආනයන බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරිමේදි නව " CS 2 (I සංශෝධන)" නව ආකෘතියෙහි සඳහන් සියලු ලිපි නිවැරදිව පරික්ෂා කර , එම ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර අදාල ලේඛනද සමඟ මා වෙත ඉදිරිපත් කල යුතු බව කාරුණිකව දන්වමි.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ
ප්‍රධාන ලේකම්
උතුරු මැද පළාත.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය
උතුරු මැද පළාත
අනුරාධපුරය.

CS 2
(I සංශෝධන)

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2018 අනුව ප්‍රථම වරට නිදහස් වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම.**

| අනු අංකය | අයදුම්පත්‍රය / ඇමුණුම | ඇත/ නැත |
|---|---|---|
| 1 | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය | |
| 2 | නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය | |
| 3 | වෙළඳ හා ආයෝජන චක්‍රලේඛ 01 / 2018 ප්‍රකාරව අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර තිබීම | |
| 4 | පත්වීම් ලිපියෙහි පිටපත | |
| 5 | පත්වීම් බලධරයා විසින් නිකුත් කරන ලද පත්වීම් ස්ථිර කිරීමේ ලිපිය | |
| 6 | II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය (අදාල තනතුරු සඳහා පමණි) | |
| 7 | පළමුවරට බලපත්‍රය ලබා ගන්නා වෛද්‍ය නිලධාරින්ගේ සීමාවාසික කාල සීමාව සඳහන් කර ඇති සහතිකය | |
| 8 | දීප ව්‍යාප්ත සේවයේ නිලධාරින් උ.මැ.ප. අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය | |
| 9 | ජාතික හැඳුනුම්පත් සහතික පිටපත | |
| 10 | වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තරය | |
| 11 | මුල් වසර 06 තුල විනය කටයුතු නොමැති බවට හා විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවට තහවුරුව/ වෛද්‍ය නිලධාරින්ගේ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ලබා ගෙන ඇති විනය කටයුතු නොමැති බවට තහවුරුව | |
| 12 | වසර 06ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට හා වාර්ෂික වැටුප් වර්ධක උපයාගෙන ඇති බවට තහවුරුව | |
| 13 | අදාල නිලධාරියා එම තනතුරෙහි රාජකාරි භාර ගැනීමේ ලිපියෙහි සහතික කල පිටපත | |

<u>සටහන</u>

I.ලිපි පිටපත් ඉදිරිපත් කිරීමේදි විධිමත් පරිදි මාණ්ඩලික නිලධාරියකු විසින් සිය නාම සහිත නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.

සකස් කලේ:- ..........................................................(නම).................................................. (අත්සන)

පරීක්ෂා කලේ :- ..........................................................(නම) .................................................(අත්සන)